# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ)

**සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අලී සාහීර් මවුලානා මහතා විසින්
2015 දෙසැම්බර් මස 11 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[48 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ)

## සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනම සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2012 අංක    දරන සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම සංස්ථාගත කිරීම.

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාවේ සියලුම ජනකොටස් අතර සමාව, හොඳ හිත, වැටහීම හා සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම;

(ආ) තක්කියා පල්ලි හා අරාබි අධ්‍යාත්මික පාසල් සහ අනාථ ළමුන්ට නිවාස ඉදිකිරීම;

(ඇ) දැනට මඩකළපුව දිස්ත්‍රික්කයේ ඇති කාත්තන්කුඩි මුහියද්දීන් තක්කියා, කාංකේයන්ඕඩයි මුහිද්දීන් තක්කියා සහ මහනුවර දිස්ත්‍රික්කයේ ඇති මද්රසතුල් මින්හාජිය්යා හා අනාථ නිවාසය යැයි ද ප්‍රචලිත "මස්ජිදුර් රිෆාය්යි හා අරාබි ආධ්‍යාත්මික විද්‍යාලය සහ අනාථ නිවාසය" කළමනාකරණය කරමින් එය පවත්වාගෙන යාම;

(ඈ) සෙය්යිද් කෝයා තංගල් හා වත්මන් ආධ්‍යාත්මික නායකයා වන සෙය්යිද් මුහම්මද් බුහාරි නල්ල කෝයා තංගල් විසින් ස්ථාපනය කරන ලද ආයතන කළමනාකරණය කිරීම;

(ඉ) සුන්නතුල් ජමාඅත් නිර්දේශ අනුව පිවිතුරු ඉස්ලාම් ධර්මය ප්‍රවර්ධනය කිරීම;

(ඊ) මුස්ලිම්වරුන් අතර මෙන් ම අන් ආගමික ජනකොටස් අතර ද එක්සත් බවේ උද්වේගයක් ඇති කිරීම හා සැමදෙනා අතර සුහදත්වය සහ හොඳ හිත වගා කිරීම;

(උ) ඉස්ලාම් ධර්මයට අදාළ විෂයයන් පිළිබඳ ප්‍රසිද්ධ කථන පැවැත්වීම;

(ඌ) මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික යහපත උදෙසා ආගමික මෙන් ම ලෞකික අධ්‍යාපන විෂය මාලාවන් ප්‍රවර්ධනය කිරීමට දායක වීම;

(එ) මුහම්මද් (සල්) තුමාණන්ගේ මෙන් ම ඉස්ලාමය වෙනුවෙන් සේවය කළ උතුමන්ගේ උපන්දින උත්සව හා සංවත්සර උත්සව පැවැත්වීම;

(ඒ) ශ්‍රී ලාංකීය ජනකොටස් අතර එකමුතුබව වැඩි දියුණු කිරීමේ අරමුණින් විවිධ සාමාජික හා සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම;

(ඔ) කිසිදු ජාති, බස්, ආගමික, කුලමල වෙනස්කම් නොසලකා අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, සෞන්දර්යාත්මක හා

ක්‍රීඩා පහසුකම් ප්‍රවර්ධනය කිරීමට දායක වීමේ අරමුණින් යුතුව විවිධ උත්සව හා තරග සංවිධානය කිරීම;

(ඕ) දුගී, අසරණ හා රෝගී අයට වෛද්‍ය පහසුකම්, අත්‍යවශ්‍ය ආහාරපාන හා අනෙකුත් සහන සැලසීම හා අවතැන් වූවන්ට, අසරණ මහලු අය සහ ළමුන් ද රැක බලා ගන්නා නිවාස පිහිටුවීම. තව ද, වැඩිහිටියන්ට සහ ළමුන්ට දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා ඒවා නඩත්තු කිරීම; සහ

(ක) සම අරමුණු ඇති දෙස් විදෙස් සංවිධාන සමඟ එක්ව හා හවුල් වී ක්‍රියා කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම, වැසීම, මුරිදීන්ස්, මුහිබීන්ස් හෝ අනුගාමිකයන්ගේ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හා එකතු කිරීම, ස්වකීය අරමුදල් සංස්ථාව විසින් ගන්නා ලද හෝ පවරා ගන්නා ලද ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේවල් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු එකොළොස් දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා වූ ශුද්ධ වූ මොහමඩ් සෙය්යිද් බුහාරි නල්ල කෝයා තංගල් අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර, ඉන් අනතුරුව එවකට සභාපතිවරයා ලෙස ධුරය දරන තැනැත්තාගේ ළඟ ම ඥාතියා, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළඟ සභාපතිවරයා විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර

ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ ඔවුන් ඇතුළත් කර ගැනීම, දායක මුදල් ලබා දීම, ගෙවිය යුතු ගාස්තු, ඔවුන් නෙරපීම සහ ඉල්ලා අස්වීම;

(ආ) පාලක මණ්ඩලයේ ධුර කාලය, එහි සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම, එහි ඇබෑර්තු පිරවීම සහ එහි සාමාජිකයන් තෝරා පත්කර ගැනීම;

(ඇ) පාලක මණ්ඩලයේ සහ වාර්ෂික මහා සභා රැස්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, එබඳු රැස්වීම් කැඳවීම සහ ගණපූරණය සහ ඒවායේ වැඩකටයුතු පවත්වාගෙන යාම;

(ඈ) ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි ඇතුළුව පදනමේ විවිධ නිලධාරීන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, රාජකාරි කටයුතු සිදුකිරීම සහ කර්තව්‍ය;

(ඉ) පදනමේ වත්කම්, දේපල පරිපාලනය සහ කළමනාකරණය සහ අරමුදල්වල භාරකාරත්වය ; සහ

(ඊ) පදනමේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය එබඳු ඕනෑම වෙනත් දේ.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයන් එහි තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නියාදන, පැවරුම්, පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු ම මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව සතු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් හා විගණනය.**

**8.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, සෑම වර්ෂයක ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.**

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පැවරෙන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපල විකිණීම, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ශුද්ධෝත්තම අස්සෙයිද් අශ්ෂෙයික් අබ්දුර් රෂීඩ් කෝයා තංගල් කද්දසල්ලාහු ශිර්රාහුල් අසීස් තුමාට ඇත්තේ ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**10.** සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිට බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.